ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

***

පුවත්පත් නිවේදනය

**<u>ගෝලීය සමුද්‍රීය ඉන්දියා සමුළුව හඳුන්වාදීමේ වැඩසටහන</u>**

ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය 2023 ඔක්තෝබර් 17-19 දිනවල මුම්බායි හිදි පැවැත්වීමට නියමිත ගෝලීය සමුද්‍රීය ඉන්දියා සමුළුව පිළිබඳ හඳුන්වාදීමේ වැඩසටහනක් 2023 සැප්තැම්බර් 22 වන දින කොළඹ දී සංවිධානය කර තිබිණ. වරාය, නාවික කටයුතු සහ ගුවන්සේවා අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා මහතා මෙහි ප්‍රධාන ආරාධිත අමුත්තා වශයන් සහභාගී විය. ඉන්දියාව නියෝජනය කරමින් ඉන්දියානු රජයේ වරාය, නාවික කටයුතු සහ ජල මාර්ග අමාත්‍යාංශයේ ලේකම් ටී. කේ. රාමචන්ද්‍රන් මහතා අතථ්‍ය අයුරින් වැඩසටහන හා එක් විය. ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් ගෝපාල් බාග්ලේ මහතා, ශ්‍රී ලංකා රජයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සහ ව්‍යාපාර සහ කර්මාන්ත ක්ෂේත්‍රයේ නියමුවන් රැසක් ද මෙම අවස්ථාවට සහභාගී වූහ.

2. පිළිගැනීමේ කතාව සිදු කරමින් මහ කොමසාරිස්තුමා සමුද්‍රීය ක්ෂේත්‍රය තුළ ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර සහයෝගීතාවයේ වැදගත්කම අවධාරණය කළේය. ශ්‍රී ලංකා ජනාධිපතිතුමා විසින් මෑතකදී සිදු කරන ලද ඉන්දීය සංචාරය අතරතුර එළිදක්වන ලද ආර්ථික හවුල්කාරීත්ව දැක්මෙහි සඳහන් පරිදි සමුද්‍රීය සම්බන්ධකතාවය ඉහළ නැංවීම සඳහා දෙරටෙහි ම රජයන් කටයුතු කරන බව එතුමා ප්‍රකාශ කළේය. 2023 ඔක්තෝබර් මාසයේදී ඉන්දියාවේ පැවැත්වෙන සමුළුව සඳහා සහභාගිත්වය තහවුරු කිරීම සම්බන්ධයෙන් මහ කොමසාරිස්තුමා වරාය, නාවික කටයුතු සහ ගුවන්සේවා අමාත්‍යතුමාට සිය ස්තුතිය පළ කළ අතර ශ්‍රී ලංකාව සමුළුවේ ‘සහකාර රාජ්‍යයක්’ ලෙස නම් කර ඇති බව ද සඳහන් කළේය.

3. ඉන්දියානු රජයේ වරාය, නාවික කටයුතු සහ ජල මාර්ග අමාත්‍යාංශයේ ලේකම් ටී. කේ. රාමචන්ද්‍රන් මහතා ගෝලීය සමුද්‍රීය ඉන්දියා සමුළුව ගෝලීය සහ කලාපීය හවුල්කාරීත්වයන් ප්‍රවර්ධනය කරමින් සහ ආයෝජන සඳහා පහසුකම් සලසමින් ඉන්දීය සමුද්‍රීය ආර්ථිකය ඉහළ නැංවීම අරමුණු කරගත් ප්‍රමුඛ පෙළේ වැඩසටහනක් බව ප්‍රකාශ කළේය. ඉන්දියාවේදී පැවැත්වෙන මෙම තෙදින සමුළුව සඳහා වරාය, නාවික කටයුතු සහ ගුවන්සේවා අමාත්‍යතුමා ප්‍රමුඛ ශ්‍රී ලංකා නියෝජිත පිරිසගේ සහභාගීත්වය සාදරයෙන් පිළිගන්නා බව එතුමා සඳහන් කළේය. මෙම සමුළුව ගෝලීය සමුද්‍රීය ක්ෂේත්‍රයේ පාර්ශවකරුවන්, ප්‍රතිපත්ති සම්පාදකයන් සහ නියාමකයන්, අදහස් ලබාදෙන ප්‍රධාන නායකයන් සහ ක්ෂේත්‍රයේ නායකයන් ඉහළ අන්තර් ක්‍රියාවන්ගෙන් සමන්විත සංවාද මාලාවක් හරහා එක් වේදිකාවකට ගෙන එනු ඇත. මෙම වැඩසටහන ශ්‍රී ලංකාවේ සමුද්‍රීය යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ඉන්දියාවෙන් ආයෝජන ආකර්ෂණය කරගැනීමට අවස්ථාවක් ලබා දෙනු ඇති බව ද එතුමා සඳහන් කළේය. එය ව්‍යාපාර ව්‍යාපාර අතර වඩා ඉහළ අන්තර් ක්‍රියාකාරකම්වලට පහසුකම් ද සලසනු ඇත.

4. ගෝලීය සමුද්‍රීය ඉන්දියා සමුළුවට ආරාධනා කිරීම සම්බන්ධයෙන් ස්තුති කළ අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා මහතා සමුද්‍රීය ක්ෂේත්‍රයේ වර්ධනය වෙනුවෙන් සමීප සහයෝගීතාවයේ, දැනුම හුවමාරු කිරීමේ සහ නව තාක්ෂණය යොදාගැනීමේ වැදගත්කම අවධාරණය කළේය. ශ්‍රී ලංකාවේ වරාය සංවර්ධනය සඳහා ඉන්දියාව ලබා දෙන ආයෝජන එතුමා අගය කළ අතර ත්‍රිකුණාමලය කාර්මික කලාපය සංවර්ධනය කිරීම උදෙසා සමීපව කටයුතු කිරීම සඳහා දෙරටෙහිම රජයන් දැඩි උනන්දුවකින් කටයුතු කරන බව ප්‍රකාශ කළේය. යාපනය සහ චෙන්නායි අතර ගුවන් සේවා ඇරඹීම සඳහා ඉන්දියාව ලබා දුන් සහයෝගය සිහිපත් කළ අමාතතුමා දෙරට අතර ප්‍රවාහන බෝට්ටු සේවා නුදුරේදී ඇරඹෙනු ඇති බව සඳහන් කළේය.

5. කොළඹ වරායේ සවුත් ඒෂියා ගේට්වේ ටර්මිනල් හි ප්‍රධාන විධායක නිලධාරී රොමේෂ් ඩේවිඩ් මහතා ද මෙම අවස්ථාව ඇමතූ අතර එතුමා එහිදී සමස්ත කලාපයේම ආර්ථික වර්ධනය වේගවත් කිරීමෙහි ලා සමුද්‍රීය

ක්ෂේත්‍රයේ ඉන්දියා  - ශ්‍රී ලංකා සහයෝගීතාවයේ විභවතාවය අවධාරණය කළේය. ඉන්දියානු වාණිජ සහ කර්මාන්ත මණ්ඩලය, ලංකා වාණිජ මණ්ඩලය, ඉන්දු - ලංකා වාණිජ මණ්ඩලය, සිලෝන් ඇසෝෂියේෂන් ඔෆ් ෂිපින් ඒජන්ට්ස්, ඇසෝෂියේෂන් ඔෆ් කන්ටේනර් ට්‍රාන්ස්පෝටර්ස්, ශ්‍රී ලංකා ලොජිස්ටික්ස් ඇන්ඩ් ෆ්‍රෙයිට් ෆෝවර්ඩර්ස් ඇසෝෂියේෂන්, ශ්‍රී ලංකා හබ් ඔපරේටර්ස් ඇසෝෂියේෂන්, ශ්‍රී ලංකා ලොජිස්ටික්ස් ප්‍රවයිඩර්ස් ඇසෝෂියේෂන්, ශ්‍රී ලංකා ෂිපර්ස් කවුන්සිල් සහ ජාත්‍යන්තර වාණිජ මණ්ඩලය වැනි ප්‍රමුඛ පෙළේ සංගම් නියෝජනය කරමින් ජ්‍යෙෂ්ඨ නිලධාරීන් රැසක් ද මෙම අවස්ථාවට සහභාගී වූහ.

***

කොළඹ
2023 සැප්තැම්බර් 25